රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය
பொது நிர்வாக மற்றும் முகாமைத்துவ அமைச்சு
MINISTRY OF PUBLIC ADMINISTRATION AND MANAGEMENT

ඒකාබද්ධ සේවා අංශය இணைந்த சேவைகள் பிரிவு COMBINED SERVICES DIVISION

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව. சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை. Independence Square, Colombo 07, Sri Lanka

දුරකතනය தொலைபேசி: (94) 011- 2694560 | ෆැක්ස් தொலைநகல்: (94) 011- 2692254 | ඊ-මේල් மின்னஞ்சல்: dgcs@pubad.gov.lk | වෙබ් අඩවිය இணையத்தளம்: www.pubad.gov.lk

මගේ අංකය / எனது இல / My No: PA/CS/POLICY/වා.ස්.මා.2016
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2016.01.29

අමාත්‍යාංශ ලේකම්වරුන්, දිස්ත්‍රික් ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

**<u>ඒකාබද්ධ සේවාවන්හි වාර්ෂික ස්ථාන මාරු - 2016</u>**

ඒකාබද්ධ සේවාවන් සම්බන්ධයෙන් වූ වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ වගකීම එම සේවාවන් සඳහා වූ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ බලය අභිනියෝජිත බලධරයා ලෙස ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත පැවරී ඇත්තේය. ඒ අනුව වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක කළ යුතු ආකාරය සඳහන් අංක:1589/30 හා 2009.02.20 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළකරනු ලැබ ඇති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ XVIII පරිච්ඡේදයේ විධිවිධාන අනුව 2016 වර්ෂය සඳහා වූ වාර්ෂික ස්ථාන මාරු ක්‍රමය ක්‍රියාත්මක කර ඇත.

02. එහෙත් එම වාර්ෂික නියෝග නිසි පරිදි ක්‍රියාත්මක නොවන බව වාර්තා වූ හෙයින් එම තත්ත්වය රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත වාර්තා කරන ලදී. එය සලකා බැලූ රාජ්‍ය සේවා කොමිෂන් සභාව, 2016 වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධයෙන් නිකුත් කරන ලද 2015.06.16 දිනැති අංක:03/2015 දරණ ඒකාබද්ධ සේවා චක්‍රලේඛයෙහි විධිවිධාන වලට පටහැනිව කටයුතු කරනු ලබන ආයතන ප්‍රධානීන්ට හා ඒකාබද්ධ සේවයේ නිලධාරීන්ට විරුද්ධව විනයානුකූලව කටයුතු කළ යුතු බවට තීරණය කර ඇති බව ද ඒ අනුව වාර්ෂික ස්ථාන මාරු නියෝග පැහැර හැර ඇති ඒකාබද්ධ සේවයේ නිලධාරීන් සම්බන්ධව විනයානුකූලව කටයුතු කර ඒ බව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත වාර්තා කරන ලෙස ද එම කොමිෂන් සභාවේ ලේකම්ගේ අංක: PSC/APL/13/96/2015 හා 2016.01.27 දිනැති ලිපියෙන් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත දන්වා ඇත.

02. වාර්ෂික ස්ථාන මාරු නියෝග නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සියළුම දෙපාර්තමේන්තු සහ ආයතන ප්‍රධානීන්ගේ වගකීමක් වන අතර ඒ සම්බන්ධයෙන් 2015.06.16 දිනැති අංක:03/2015 දරණ ඒකාබද්ධ සේවා චක්‍රලේඛයෙහි අංක:08 වගන්තිය යටතේ දක්වා ඇති "වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ වගකීම" යටතේ 8.1 සිට 8.8 දක්වා වූ කරුණු කෙරෙහි අවධානය යොමු කරවනු ලැබේ. පහසු අවධානය සඳහා එහි 8.3 සහ 8.4 වගන්ති උධෘත කොට පහත දක්වා ඇත.

"8.3. වාර්ෂික ස්ථාන මාරු නියෝග මගින් අමාත්‍යාංශයෙන් / දෙපාර්තමේන්තුවෙන් පිටතට ස්ථානමාරුවීම් ලබා දී ඇති නිලධරයන් අනුප්‍රාප්තිකයන් පැමිණෙන තෙක් රඳවා නොගෙන නියමිත දින නව සේවා ස්ථානයේ රාජකාරි භාරගැනීමට හැකි වන සේ ඔවුන් මුදාහැරීමට කටයුතු කළ යුතුය. මෙම විධිවිධාන වලට පටහැනිව කටයුතු කරන ආයතන ප්‍රධානීන් සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කිරීම පිණිස අදාළ බලධරයා වෙත වාර්තා කරනු ලැබේ.

8.4 ස්ථාන මාරුවීම් ලැබූ නිලධරයන් නියමිත දින සිට නව සේවා ස්ථානයේ රාජකාරී කටයුතුවලට වාර්තා කර තිබියදීත් ඇතැම් දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් අදාළ නිලධරයන් මුදාහැර නොමැති අවස්ථා වාර්තා වී ඇත. එවැනි අවස්ථා උද්ගත නොවීමට ආයතන ප්‍රධානීන් වගබලා ගතයුතු අතර එම නිලධාරීන් මුදා නොහරින්නේ නම් තවදුරටත් වැටුප් ගෙවීම සම්බන්ධයෙන් ආයතන ප්‍රධානීන් විසින් වගකීම භාරගත යුතුය. "

05. එබැවින් 2016.02.05 දිනට හෝ එදිනට පෙර 2016 වර්ෂය වෙනුවෙන් වූ ඒකාබද්ධ සේවාවන්හි වාර්ෂික ස්ථාන මාරු නියෝග නියමිත අයුරින්ම ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස සියළුම දෙපාර්තමේන්තු සහ ආයතන ප්‍රධානීන් වෙත මෙයින් දන්වනු ලැබේ. එසේ නොවුණහොත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග පරිදි අදාළ නිලධාරීන්ට විරුද්ධව විනයානුකූලව කටයුතු කිරීමට සිදුවන බව ද වැඩිදුරටත් දන්වමි.

**ජේ. දඩල්ලගේ**
ලේකම්
රාජ්‍ය පරිපාලන සහ කළමනාකරණ අමාත්‍යාංශය.

පිටපත: ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව - කරු. දැ.ගැ.ස.